# සිසිඳුා මියුරු ගී සැඳෑව

*යෞවනත්වයේ සිටිමින් සිසිර ඉන්ද්‍රානිගේ ගීත වලින් මුසපත් වූ හදවත් අද වැඩිහිටියන් වෙමින් මුහකුරා ගිය හදවතින් ඔවුනට ආදරය කරනා රසිකයෝද බොහෝ වෙති.*



## මෙල්බර්න් පුරවරයේදී

දශක පහකටත් වැඩි කාලයක් සංගීත ක්ෂේත්‍රයේ සංගීත ලෝලී සුවහසක් ශ්‍රාවකයන්ගේ මනදොල සංසිදුවාලමින් මිනිස් චින්තනයට සෙනෙහසකින් ආමන්ත්‍රණය කළ ඒ ලයාන්විත වූ මධුර වූ ද්වන්ද හඬ තුලින් ශ්‍රාවක සිත් සතන් තුල සදා ලැගුම්ගත් ගායන ශිල්පීන් දෙදෙනා නම් ඔබේත් මගේත් ප්‍රියතම, ආදරණීය සිසිර සේනාරත්න හා ඉන්ද්‍රානී විජේබණ්ඩාරයි. මෙම ගායක යුවල ගැයූ ගීත එදා සිට අද දක්වාම රූපවාහිනිය, ප්‍රසංග වේදිකාව කරන්නට දැක්වූවා පමණක් නොව ශ්‍රාවක සිත් සතන් ගීතයෙන් අමන්දානන්දයට පත් කරමින් ප්‍රබුද්ධ කලා රසිකයන් රසගැන්වීමට හැකිවිය. ස්වකීය සහජ නිපුණතා දේශීය සංගීත ක්ෂේත්‍රයට පමණක් නොව ඔවුනට ආවේනික වූ මධුරවූ සුමියුරු වූ හඬින් ගායනා කර ස්වකීය රසික සහෘද ශ්‍රී ලාංකීය ජනතාවටද දායාද කළෝය. තම දේශයට අපූර්වතම වූත් අනගිභවනීය වූත් කටහඬක් දායාද කළ මොවුන් ඕලු නෙලුම් අලෝකේ මිතුරා සුදු සඳ එළියේ යන ගීත තම සංගීත දිවියේ නිම් වලලු පුළුල් කරමින් සහෘද ජනයාගේ සිත් තමන් වෙත තදින්ම ඇද බැද ගැනීමට සමත් විය. සිසිර සේනාරත්න නම් වූ මේ දැවැන්ත සංගීත වේදියා රජයේ සංගීත විදුහලේ මුල්ම සිසුන් ගෙන් එක් එක් අයෙකු වීය. පලමුවරට "පොඩි පුතා" නම වූ චිත්‍රපටයේ ගීතයකින් එක් රැයක් පහන් වන්නට කලින් ජනප්‍රියත්වයේ කිරුල පැලඳීය. ඉන් පසුව චිත්‍රපට ගණනාවක ගීත ගායනා කර එකල ගුවන් විදුලියේ විශිෂ්ඨ ශ්‍රේණියේ ගායකයකු ලෙස සරල ගී ඉදිරිපත් කරමින් ශ්‍රාවක සිත් සතන් තුල සදා ලැගුම් ගැනීමට සමත් විය. ඔහු ගායකයකු පමණක් නොව විශිෂ්ඨ සංගීතඥයකුද විය. ඔහු සංගීතය සැපයූ චිත්‍රපට ගනන දහයක් පමණ විය. එකල ඉතා ජනප්‍රිය වූ "හඳපාන" ඔහුගෙ මුල්ම චිත්‍රපට සංගීතයයි. එය ඔහුගේ මුල්ම සංගීතය සැපයූ චිත්‍රපටය පමනක් නොව එයට එම වසරේ හොඳම සංගීත අධ්‍යක්ෂණයට හිමි සරසවි සම්මානය ද හිමි විය. වරක් ඔහු පුංචි බබා චිත්‍රපටියේ "මාගේ පුතුට මල්"ගීය වෙනුවෙන් හොඳම ගායකයා ලෙසද සම්මාන දිනීය. "මදර්" සංවිධානය මගින් පිරිනැමූ හොඳම සංගීතවේදියාට හිමි සම්මානය ඔහුගේ සංගීත දිවියේ කඩඉමකි. පදරචනය, ගායනය හා සංගීත අධ්‍යක්ෂනය සඳහා විරල ඝනයේ කලාකරුවන් උදෙසා පිරිනමන "ඔස්කා" විශිෂ්ඨ සම්මානයෙන්ද ඔහු පිදුම් ලබා ඇත. එහි ඇති විශේෂත්වය නම් මෙවන් සම්මානයකින් පිදුම් ලද මුල්ම හා එකම තැනැත්තා සිසිර වීමය.

සුනිල් සාන්ත නැමැති දැවැන්ත සංගීතවේදියා සමග යුග ගීතයක් ගැයීමේ වරප්‍රසාදය ලැබීම ඇගේ ජීවිතයේ පලමු වරට ලද භාග්‍යයයි. ඉන්පසු ලමා ගායිකාවක් ලෙස සංගීත දිවියේ අත්පොත තැබූ ඇය දැවැන්ත කලාකරුවන් වූ අමරදේව සුනිල් ප්‍රේමරත්න සමග ගීත ගැයීමේ විරල අවස්ථාව ලබා ගත් ප්‍රතිභාපූර්න ගායිකාවක් විය. ඉන්ද්‍රානි පෙරේරා නම් වූ ඇය ද ගුවන් විදුලියේ විශිෂ්ඨ ශ්‍රේනියේ ගායිකාවක් වූවාය. "රේඛාව" ඇගේ මුල්ම චිත්‍රපටයයි. ඇය එහි ගැයු ලමා ගීත ඉතාමත් ජනප්‍රිය විය. ඉන් පසු ඇය ලමා ගීත ද අතුළුව චිත්‍රපට හතලියක පමන ගීත ගායනා කර ඇත. වර්ෂ 1957 වසරේ හොඳම ගායිකාව ලෙස රේඛාවේ ගැයූ ගී වෙනුවෙන් "දීපශිඛා" සම්මානයෙන් පිදුම් ලැබුනි. එය මේ රටේ ගායිකාවකට පිරිනැමුනු මුල්ම සම්මානය විය. සිංහල සිනමාවේ ගීත ක්ෂේත්‍රය වෙනුවෙන් ඇයගේ කැපවීම උදෙසා ජනාධිපති සම්මානයත් ජීවිතයේ එකම වරක් පිරිනැමෙන සරසවියෙන් ලද "රණ තිසර" සම්මානයත් ඇගේ සංගීත දිවයේ සුවිශේෂී මං සලකුනු වේ. කිසිදු වියපත් නොවන කටහඬක් උරුම වූ ඇය ශ්‍රී ලංකාවේ ගීත කෝකිලාවියකි. ඇය ගැයූ ගී අතර නාමල කෝමලී, වෙසක් කැකුළු, ඔබ ගතිනා, රතුපාට මල්, දඟකාරී මං ආදී ගීත ශ්‍රී ලාංකිකයන්ගේ හුස්ම පොද සමග ඔවුන්ගේ ලේ ඇට මිදුළු පුරා විහිදී සංරක්ෂන වුනු ගීත වේ.

අනුකරනයෙන් ඈත් වෙමින් තම ගායන වාදන සත්කාර්යය සනිටුහන් කරන්නට සිසිර හා ඉන්ද්‍රානි දෙපොල ඇරඹූ "සිසිනඳා" සංගීත ප්‍රසංගය ශ්‍රී ලාංකීය ගීත රසිකයන් වැලඳ ගත්තේ දැඩි දයාර්ද බවකිනි. යෞවනත්වයේ සිටිමින් සිසිර ඉන්ද්‍රානිගේ ගීත වලින් මුසපත් වූ හදවත් අද වැඩිහිටියන් වෙමින් මුහකුරා ගිය හදවතින් ඔවුනට ආදරය කරනා රසිකයෝද බොහෝ වෙති. හොඳ බෞද්ධයෙකු වූ ඔහු බොදු ගීත කිහිපයක්ද ගායනා කර ඇත. ඒ අතර "ශ්‍රී පාද වඳිමු" ගීතය ඉතාමත් ජනප්‍රිය විය. ඇය ගැයූ බෞද්ධ ගී අතර "බුදු සාමිනේ" සිරිමා බෝ මුල ආදී ගීත රසිකයින් අතර ඉමහත් ජනප්‍රියත්වයට පත් විය.

සිසිර ඉන්ද්‍රානි යුවල පවත්වන "සිසිනඳා" ගී ප්‍රසංගය දැනට රටවල් දාහතරකට වැඩි ගනනක් පවත්වා ඇති අතර එම ප්‍රසංග ය විදෙස් ගත ශ්‍රී ලාංකිකයන් අතර ඉතාමත් ජනප්‍රිය ප්‍රසංගයක් බවට පත් වී ඇත. මෙවර පැවැත්වෙන මේ ප්‍රසංගය සඳහා ඔවුන්ගෙ ජනප්‍රිය මියුරු ගීත සියල්ලම ඇතුලත් වේ. මාර්තු මස 29 වැනි දින වෙස්ලි විද්‍යාලයේ සවස 6ට, රොක් බැන්ක් "පාරමිතා" බෞද්ධ විහාරස්ථානයට ආධාර පිණිස මේ ප්‍රසංගය පැවැත්වේ.

වික්ටෝරියා ශ්‍රී ලංකා බෞද්ධ සංගමය පැවැත්වීමට සූදානම් කොට ඇති "සිසිනඳා" මියුරු ගී සැඳෑව සාර්ථක වේවායි කාරුනික සිතින් ප්‍රාර්ථනා කරමු.

බ්‍රිස්බේන් නගරයේ අප්‍රේල් 6 වෙනිදා හා සිඩ්නි නගරයේ අප්‍රේල් 20 වැනිදා මෙම ප්‍රසංග ය පැවැත්වීමට සංවිධානය කොට තිබේ.

මහින්ද දිසානායක දිවුල්ගනේ


ශ්‍රී ලාංකේය මාධ්‍ය කවුළුව.
ගොඩවන්න අදම
www.thisara.com
තිසර FM 97.4

Lead Accounting & Taxation Services
Public Accountant and Registered Tax Agent
Refunds within 14 days
Tax Returns 2007
ශ්‍රී ලාංකික ඔබට සුහද සේවය
Services
- Individual/ Business/ Investment Property Tax Returns
- Accounting/ Bookkeeping
- Preparation of Business Activity Statements(BAS)
- Audit of Non-for-Profit Organization and Self-Managed Superannuation Funds
- Personal Service and Advice

L. A. Dayananda Wimalasiri PNA
B.Com, M.Com, M.Bus, Ad.Dip.Acct.

| Office | After Hours |
|---|---|
| 1/1324 Centre Rd, Clayton 3169 | 7 Whitton Court, Rowville 3178 |
| TP 03 9544 4995 | P/F 03 9755 7400 |
| Fax 03 9544 4997 | M 0402 846 676 |

leadtax@iprimus.com.au
NIA NATIONAL INSTITUTE OF ACCOUNTANTS
PNA
Kusumsiri - Lead Design House 0430 112 088